සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 06 - 2024

## නර්තනය

කාලය පැය 01 යි විනාඩි 30

නම / විභාග අංකයඃ

### I කොටස

- **සියලු ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. හනුමා වන්නමෙන් වර්ණනා කරනු ලබන්නේ .................................... පිළිබඳවයි.
    1. වඳුරා 2. ඉබ්බා 3. ගෝනා 4. සාවා
02. "ලත් පමණට මැටි ඉදි කරවාගෙන" යන කවි පාදය අයත් ගැමි නැටුම වන්නේ,
    1. කුළු නැටුමයි 2. ලී කෙළි නැටුමයි 3. රබන් නැටුමයි 4. කළ නැටුමයි
03. "ඉර පායනවා මල් පිබිදෙනවා ලස්සන උදෑසනේ" යන ගීතය තුළින් .......................... ප්‍රකාශ වේ.
    1. ආදරය 2. සතුට 3. තරහව 4. පුදුමය
04. ද්‍රවිඩ ගැමි නැටුම් ප්‍රභේදයක් නොවන්නේ ................... නැටුමයි.
    1. කෝලාට්ටම් 2. සෙම්බු 3. ලී කෙළි 4. පින්නල් කෝලාට්ටම්
05. ගොඩ සරඹ නර්තනයේ දී භාවිත වන බෙර පදයකි.
    1. තෙයිකිට තෙයිතාම් 2.දෝං දොමිත දොම් 3. දොම්කිත කිතදොම් 4. දොදොංත තකුදොං

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න වලට වඩාත් ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

06. සරඹ අභ්‍යාසයේ දී නර්තන ශිල්පියා තුළ තිබිය යුතු මූලික ඉරියව්ව .......................................................... නමින් හැඳින්වේ. ( ගී මණ්ඩිය/ මණ්ඩිය)
07. මාත්‍රා 2+2 තාල රූපය හඳුන්වනු ලබන්නේ .................................. යනුවෙනි. (සුළු තනි තිත/ මහ තනි තිත)
08. උඩරට පා සරඹ සබරගමු සම්ප්‍රදායේ දී ......................................... ලෙස හඳුන්වයි. (දොඹින පද/ මණ්ඩි පද)
09. චල් වළල්ල ආදේශ භාණ්ඩය, ................................................ මඟින් හඬ උපදවා ගන්නා විකල්ප වාද්‍ය භාණ්ඩයකි. (ඇතිල්ලීම/ සෙලවීම)
10. පා සරඹ නර්තනයේ දී යොදා ගන්නා එකම සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩය ........................ (ගැටබෙරයයි/තාලම්පටයි).

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වල A කොටසට වඩාත් ගැලපෙන පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.**

| A | B |
|---|---|
| 11. මාට්ටුප් පොංගල් | ඉර පෑයීම. |
| 12. තාලම්පට | විකල්ප වාද්‍ය උපකරණයකි. |
| 13. වෙසක් උත්සවය | ගවයාට උපහාර කිරීම. |
| 14. පරිසර සංසිද්ධියකි. | තිත් සහ තෙයි. |
| 15. පොල් කොළ බටනලාව | තෙමඟුල සිහි කිරීම. |

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට අදාළව දී ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදිනම් (×) ලකුණ ද ඉදිරියේ ඇති කොටුවේ සලකුණු කරන්න.**

16. නර්තන ශිල්පියෙකු මණ්ඩියට සිටීමේ දී පාද අතර දුර ප්‍රමාණය රියනකි. ☐
17. එමකම, ගැමි නැටුම්වල ඇති සුවිශේෂී ලක්ෂණයකි. ☐
18. නැළවිලි කවි මඟින් මව්පිය සෙනෙහසත්, දරු සෙනෙහසත් පිළිඹිබු කරයි. ☐
19. නම්‍යතා අභ්‍යාස මගින් ආධුනිකයාගේ නර්තනයට අවශ්‍ය හැඩතල නිවැරදි කරයි. ☐
20. "පාන්දරින් ඉස්කෝලෙට" ගීතයේ ගී පද රචනය කළේ සුනිල් දයානන්ද කෝනාර මහතාය. ☐

**(එක් ප්‍රශ්නයකට ලකුණු එක බැගින් 1 x 20 මුළු ලකුණු 20)**

## II කොටස

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න දෙකක් ඇතුලුව ප්‍රශ්න තුනකට (3) පිළිතුරු සපයන්න.**

(01) පහත වගුවේ හිස්තැන්වල, අදාළ නිවැරදි පිළිතුරු ලියන්න.

| නර්තන සම්ප්‍රදාය | ප්‍රචලිත ප්‍රදේශ | ප්‍රධාන වාද්‍ය භාණ්ඩය | ප්‍රධාන ඇඳුම් කට්ටලය |
|---|---|---|---|
| 01. .................................... | මහනුවර, කුරුණෑගල, කෑගල්ල | ගැටබෙරය | 02. .................................... |
| පහතරට නර්තන සම්ප්‍රදාය | 03. ................................ | පහතරට බෙරය | තෙල්මෙ/ දෙවොල් ඇඳුම |
| සබරගමු නර්තන සම්ප්‍රදාය | රත්නපුර, කුරුවිට කලවාන | 04. ...................................... | 05. ...................................... |

(ලකුණු 2 x 5 =10)

(02) 1. කළගෙඩි කවියක් ලියන්න (ල. 02)

2. සිංහල ගැමි නැටුම් 02ක් නම් කර ඊට සමාන ද්‍රවිඩ ගැමි නැටුම් 02 ක් ලියන්න. (ල. 04)

3. ගැමි නැටුම් වල සුවිශේෂී ලක්ෂණ 04 ක් ලියන්න. (ල. 04)

(මුළු ලකුණු 10)

(03) 1. නමස්කාර සරඹය ලියන්න. (ල. 02)

2. ගුරු ගෙදර අධ්‍යාපනය හා සැබැඳි චාරිත්‍ර විධි 02 ක් හා සාරධර්ම 02ක් ලියන්න. (ල. 04)

3. වෙසක් උත්සවය තුළින් ගොඩනැගෙන සමාජ සහජීවනය පිළිබඳව ඔබේ අදහස් දක්වන්න. (ල. 04)

(මුළු ලකුණු 10)

(04) 1. සම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ 02 ක් නම් කරන්න. (ල. 02)

2. සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ වාදනය කරන අවස්ථා 04 ක් නම් කරන්න. (ල. 04)

3. විකල්ප වාද්‍ය භාණ්ඩයක රූප සටහනක් ඇඳ එය නම් කරන්න. (ල. 04)

(මුළු ලකුණු 10)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 06 - 2024

## නර්තනය - ප්‍රායෝගික පරීක්ෂණය

නම / විභාග අංකයඃ

| අනු අංකය | ක්‍රියාකාරකම | ලකුණු | මුළු ලකුණු |
|---|---|---|---|
| 01 | කැමති ජන ගායනයක්<br>නම් කරන ලද ගායනයක්<br>(නැළවිලි, කළගෙඩි, ගුරු නමස්කාරය ගුරු අභිමතය අනුව නම් කළ හැකියි.) | 05<br>05 | 10 |
| 02 | සරඹ අභ්‍යාසය<br>පා සරඹ 1, 2 හමාර පදය සහිතව<br>ගොඩ සරඹ 1 හෝ 2 කස්තිරම සමඟ කුසපත් ඇද සරඹය ලබාදෙන්න. නිර්ණායක පහකට ලකුණු ලබා දෙන්න. | 05<br>05 | 10 |
| 03 | වන්නම් නැටීම<br>හනුමා වන්නමට අදාළ අලංකාර මාත්‍රයක් ඉදිරිපත් කරන්න.<br>ගායනා කරමින් නැටීම.<br>අලංකාර මාත්‍රය ඉදිරිපත් කිරීම. | 05<br>05 | 10 |
| 04 | ගැමි නැටුම - කළගෙඩි නර්තනය (කණ්ඩායම් ක්‍රියාකාරකම)<br>අලංකාර මාත්‍රා ඉදිරිපත් කිරීම.<br>සාමූහික බව, කණ්ඩාම් හැඟීම, ප්‍රාසාංගික බව, එමකම හා කවි ගායනා කිරීම යන නිර්ණායක පාදකව ලකුණු ලබා දෙන්න. | 05<br>05 | 10 |
| 05 | නිර්මාණ නර්තනය (චරිත නිරූපණය)<br>සතුට ප්‍රකාශ වන පරිදි ඉදිරිපත් කළ හැකි චරිත නිරූපණයක් විය යුතුය.<br>සිද්ධිය ගොඩනගා ගැනීම, භාව නිරූපනය, අවකාශ භාවිතය, ප්‍රාසාංගික බව ආදී වශයෙන් නිර්ණායක පාදකව ලකුණු ලබා දෙන්න | 10 | 10 |
| | මුළු එකතුව | 50 | 50 |

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 06 - 2024

## නර්තනය - පිළිතුරු පත්‍රය

නම / විභාග අංකය:

### I කොටස

| | | | |
|---|---|---|---|
| 01. 1 | 06. මණ්ඩිය | 11. ගවයාට උපහාර කිරීම | 16. ✗ |
| 02. 4 | 07. සුළු තනිතිත | 12. තිත් හා තේයි | 17. ✓ |
| 03. 2 | 08. මණ්ඩිපද | 13. තෙමගුල සිහි කිරීම | 18. ✓ |
| 04. 3 | 09. සෙලවීම | 14. ඉර පෑයීම | 19. ✓ |
| 05. 3 | 10. තාලම්පට | 15. විකල්ප වාද්‍ය උපකරණයකි | 20. ✗ |

(එක් පිළිතුරකට ලකුණු 1 බැගින් 1 x 20 මුළු ලකුණු 20)

### II කොටස

01. 1. උඩරට නර්තන සම්ප්‍රදාය
    2. වෙස් ඇඳුම් කට්ටලය
    3. ගාල්ල, මාතර, තංගල්ල, බෙන්තර, හොරණ
    4. දවුල
    5. පබළු ඇඳුම් කට්ටලය, මල් පද ඇඳුම් කට්ටලය

(එක් පිළිතුරකට ලකුණු 2 බැගින් 2 x 5 මුළු ලකුණු 10)

02. 1. කවිය ලියා ඇත්නම් ලකුණු 2
    2. කල - සෙම්බු/ වෙම්බු ලී කෙලි/ කෝලාට්ටම් (එක් පිළිතුරකට ලකුණු 2 බැගින් 2 x 2 මුළු ලකුණු 04)
    3. සරල බව, සාමුහික බව, උපකරණ භාවිතා කිරීම, ගායනය සහිත වීම, එමකම, විනෝදදය ආදී වශයෙන් කරුණු 04 ක් ලියා ඇත්නම් ලකුණු 04යි. (එක් පිළිතුරකට ලකුණු 2 + 4 + 4 මුළු ලකුණු 10)

03. 1. තෙයියත්, තෙයියත්, තෙයියත් තාම් /// (ලකුණු 2)
    2. **චාරිත්‍ර:** දෙමාපියන් දරුවා රැගෙන ගොස් ගුරුවරයාට භාරදී බුලත් දී වැදීම, දණ්ඩි කදට නමස්කාර කිරීම, ගුරු නමස්කාරය හා ගුරු වන්දනා ගාථා ඉදිරිපත් කිරීම ආදී වශයෙන් කරුණු 02 කට ලකුණු 02 යි.

       **සාරධර්ම:** වැඩිහිටියන්ට ගරු කිරීම, ගුරුවරයාගේ කටයුතුවලට සහය දීම, ප්‍රවීණ හා සම වයස් ශිල්පීන්ට ආචාර සමාචාර කිරීම, ඉවසීම, දැරීමේ හැකියාව.
    3. දන්සැල් සංවිධානය කිරීම මගින් බැතිමතුන්ට ආහාරපාන ලබා දීම, මල් හා හඳුන්කූරු දන්සැල් පැවැත්වීම මගින් පුණ්‍යක්‍රියා වල යෙදෙන බැතිමතුන්ට උදව් උපකාර කිරීම, ආබාධිත අයට රෝද පුටු ලබා දීම, ඇස් නොපෙනෙන අයට කණ්නාඩි ලබා දීම ආදී ලෙස අසරණ අයට පිහිට වීමේ ගුණය. වෙසක් සුභ පැතුම් හුවමාරුව මගින් නෑදෑ හිතමිතුරන් අතර සුහදත්වය ගොඩනැගී හා සමාජ සහජීවනය පිළිඹිබුවී වීම ආදී වශයෙන් කරුණු 04 ක් විස්තරකර ඇත්නම් ලකුණු 04 යි.

(එක් පිළිතුරකට ලකුණු 2 + 4 + 4 මුළු ලකුණු 10)

04. 1. ගැටබෙරය, දෙවොල් බෙරය, දවුල, තම්මැට්ටම, උඩැක්කිය, රබාන ආදී වශයෙන් 02 ක් නම් කර ඇත්නම් ලකුණු 02 යි.
    2. පන්සල් හා විහාරවල තේවා හේවිසි වාදන අවස්ථා, පෙරහැර අවස්ථා, ශාන්තිකර්ම අවස්ථා, විවිධ සමාජීය හා ආගමික උත්සව ආදී ලෙස 04 ක් ලියා ඇත්නම් ලකුණු 04 යි.
    3. රූප සටහන ඇඳ නම් කර ඇත්ම් ලකුණු 04 යි.

(එක් පිළිතුරකට ලකුණු 2 + 4 + 4 මුළු ලකුණු 10)